සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
**Ministry of Women, Child Affairs and Social Security – Social Security Division**

| | | |
|---|---|---|
| මගේ අංකය / **எனது இல** / My No: DSD/HO/04/ER/Circular/2020 | ඔබේ අංකය / **உமது இல** / Your No: ........................................ | දිනය / **திகதி** / Date: 2020.02.12 |

## සමෘද්ධි චක්‍රලේඛ අංක 2020 / 5

දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්

සමෘද්ධි කළමණාකරුවන් හා සංවර්ධන නිලධාරින් වෙත,

## ආර්ථික සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන -2020

පසුගිය වර්ෂයන්හිදි ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා ඔබ ඇතුළු සියළු සමෘද්ධි නිලධාරින් දක්වන ලද සහාය පළමුව අගේ කොට සලකමි.

2020 වර්ෂය තුල දි රට හදන ජාතික රාජ්‍ය ප්‍රතිපත්තිය වු "සෞභාග්‍යයේ දැක්ම" යථාර්ථයක් බවට පත්කරමින් දිළිඳුකම පිටුදැකීම සඳහා වු රාජ්‍ය ප්‍රතිපත්තියට සමගාමීව සමෘද්ධිලාභින් හා අඩුආදායම්ලාභින් සවිබලගැන්වීම ඉලක්ක කර ගනිමින් පහත සඳහන් පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා සැලසුම් සකස් කර ඇති බව පළමුව කාරුණිකව දන්වා සිටිමි.

### ක්‍රියාත්මක වැඩසටහන්

1. සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන
2. සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් සවිබලගැන්වීම සඳහා රියදුරු පුහුණුව ලබාදීමේ වැඩසටහන
3. විශේෂ ජීවනෝපාය ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන
4. සමෘද්ධි ශිල්පීය සවිබලකරණ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන.
5. විවිධ ව්‍යාපෘති හා ආයතන සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක වැඩසටහන්

ඒ අනුව ඒ ඒ වැඩසටහන් ඔබ දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කල යුතු ආකාරය පිළිබඳව උපදෙස් පහත පරිදි වනු ඇත.

### 1. සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන

2020 වර්ෂය තුල දේශීය හා විදේශීය වෙළඳපොල ඉලක්ක කර ගනිමින්, පෞද්ගලික අංශය හා ඒකාබද්ධව ඉදිරි වෙළඳ ගිවිසුම් ගතවී, එම වෙළඳපොල ඉලක්ක කර ගනිමින් නව ආදර්ශ ගම්මාන


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

තෝරා ගැනීමට සහ දැනටමත් පවත්නා නිෂ්පාදන ගම්මාන වැඩි දියුණු කිරීම මෙම වර්ෂයේ ප්‍රධාන අරමුණ වේ.

මේ යටතේ එක් දිස්ත්‍රික්කයකින් ගම්මාන 02 බැගින් හඳුනා යුතු අතර එම ගම්මාන හඳුනා ගැනීමේ සිට වැඩසටහන ක්‍රියාත්මක කිරීම දක්වා උපදෙස් පහත පරිදි වේ.

### 1.1 ගම්මාන හඳුනා ගැනීමේ නිර්ණායක

i. දේශීය හෝ විදේශීය වෙළඳපොල ඉල්ලුම සැලකිල්ලට ගෙන හෝ අපනයන විභවයක් සහිත හෝ ආනයන ආදේශකයක් ලෙස සැලකිය හැකි වාර්ෂික හෝ බහු වාර්ෂික භෝග දැනටමත් වගා කර ඇති, හෝ නව වගාවන් කිරීමට යෝග්‍ය ගම්මාන

ii. නිෂ්පාදනයේ යෙදෙන පිරිසෙන් වැඩි පිරිසක් සමෘද්ධිලාභී / අඩු ආදායම්ලාභී වීම.

iii. නිෂ්පාදන හෝ සේවාව බහුතරය සමජාති වීම.

iv. නිෂ්පාදනයේ යෙදෙන පිරිස තම ජීවන මාර්ගය වැඩිදියුණු කර ගැනිමට කැමැත්තක් හා උනන්දුවක් දැක්වීම.

v. අදාල ගම්මානය අවට සම නිෂ්පාදන සිදු කරන ගම්මාන වේ නම් එම ගම්මාන ද ඇතුලත්ව පොකුරු ගම්මානයන් ලෙස සංවර්ධනය කිරීමේ හැකියාව.

vi. කීල්ස් / කාගිල්ස්/ එක්ස්පෝ ලංකා ආයතන සමඟ ඉදිරි වෙළඳ ගිවිසුම් ගතවී ක්‍රියාත්මක කිරීමට මේ වන විටත් තෝරාගෙන ඇති එළවළු, පලතුරු, දියර කිරි ආදී නිෂ්පාදන මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ආශ්‍රිත ගම්මාන. (දැනටමත් ඔබ විසින් තෝරා එවා ඇති ගම්මාන සඳහා අතිරේක ප්‍රතිපාදන වෙන් වෙනු ඇත.)

### 1.2 ප්‍රතිපාදන වෙන් කිරිම

i. එක් නිෂ්පාදන ගම්මානයක් සඳහා රු.මි. 2 ක ප්‍රතිපාදන වෙන්වේ. ව්‍යාපෘති සඳහා දෙපාර්තමේන්තු දායකත්වය 60 % ක් වන අතර ලබා දිය හැකි උපරිම ප්‍රතිපාදන ප්‍රමාණය රු.45,000 /- ක් වේ. අවම ප්‍රතිලාභී දායකත්වය 40% ක් විය යුතු වේ. ප්‍රතිලාභී දායකත්වය ශ්‍රමය, අමුද්‍රව්‍ය හෝ වෙනත් දායකත්වයක් විය හැකිය.

iii. සකස් කළ ව්‍යාපෘති වාර්තා ප්‍රාදේශීය ලේකම් සහ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ නිර්දේශයන් සමඟින් 2020.04.30 දිනට පෙර මා වෙත එවිමට කටයුතු කල යුතු වේ.

## 2. සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් සවිබලගැන්වීම සඳහා රියදුරු පුහුණුව ලබාදීම.

වාහන සංඛ්‍යාවේ සීඝ්‍ර වර්ධනයත් මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේ වසරකට සිදුවන අනතුරු සංඛ්‍යාවත් සැලකිල්ලට ගෙන විධිමත් පුහුණුවලත් විනීත රියදුරන්ගේ දැඩි අවශ්‍යතාවයට යම් දායකත්වයක්

සපයමින් ඒ හරහා  සමෘද්ධි හා අඩුආදායම්ලාභි පවුල් සවිබලගැන්වීම  මෙම වැඩසටහනේ අරමුණ වනු ඇත.

ඒ සඳහා  සමෘද්ධිලාභී සහ අඩු ආදායම්ලාභි පවුල් වල අවුරුදු 18 – 40 අතර තරුණ  තරුණියන්ට අවස්ථාවක් ලබා දීමටත් ඔවුන් රැකියාගත කර ඵලදායි ආර්ථික ක්‍රියාවලියක නිරත කරවීමටත්  ජාතික ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දායක කරගැනීමටත් මේ තුලින් ඔබ වෙත හැකියාව ලැබෙනු ඇත.

2.1 ඒ අනුව වයස අවුරුදු 18 ත් 40 ත් අතර රැකියා විරහිත, රියදුරු බලපත්‍රයක් ලබාගැනීමට සුදුසු කායික මානසික යෝග්‍යතාවයකින් යුතු,  පුහුණුවෙන් පසුව මෙම ක්ෂේත්‍රයට අදාලව රැකියාගත වීමට කැමැත්තක් දක්වන  සමෘද්ධි ප්‍රතිලාභී හෝ අඩු ආදායම්ලාභී පවුල් වල තරුණ තරුණියන්  ඇමුණුම 01 ට අනුව 2020.04.25 දිනට පෙර හඳුනා ගත යුතුවේ.

2.2 ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකට  පුහුණුලාභීන්  10 දෙනෙකු  හඳුනාගත හැකි අතර  ප්‍රජා මූල ගම්මාන සමිතියේ එකඟත්වය සහිතව වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් අදාල  නාම ලේඛන ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළයුතුය. ව්‍යාපෘති කළමණාකරු විසින් මොවුන් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා නියමිත කාලය තුල පුහුණුව සඳහා සහභාගිවීමේ හැකියාව ඇති අයවලුන් පමණක්  තෝරා ගතයුතුය. ප්‍රාදේශිය ලේකම් විසින් එම නාමලේඛන නිර්දේශ කර දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂක වෙත අනුමැතිය සඳහා  ඉදිරිපත් කළ යුතු අතර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් කොට්ඨාශ මට්ටමින් වූ සාරාංශ වාර්තාව 2020.04.30 දිනට පෙර මා වෙත  ඉදිරිපත් කළ යුතුවේ.

2.3 ප්‍රතිපාදන සඳහා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද පසු දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය මත සුදුසු ආයතන තෝරා අවශ්‍ය පුහුණුව ලබාදීමට කටයුතු කළ යුතුවේ.

2.4 එක් ප්‍රතිලාභියෙක් වෙනුවෙන් බරවාහන රියදුරු පුහුණුව සඳහා රු. 10,000/- ක් ද සැහැල්ලු වාහන  රියදුරු පුහුණුව  සඳහා රු. 9,000/- ක් ද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙන අතර අනෙකුත් සියළුම වියදම් පුහුණුලාභියා විසින් දැරිය යුතුය. පුහුණුව සඳහා ඉදිරිපත් වීමේදී ජාතික ප්‍රවාහන  මධ්‍යස්ථානයෙන් වෛද්‍ය වාර්තාවක් ලබා ගැනීම අනිවාර්යය වන අතර මේ සඳහා වැයවන මුදල පුහුණුලාභියා විසින් දැරිය යුතුය. මෙහිදී එක් ප්‍රතිලාභියෙකු බරවාහන හෝ සැහැල්ලු වාහන යන දෙකින් එක් අවස්ථාවකට පමණක් ඉල්ලුම් කල යුතුය.

2.5 මෙහිදී යම් ප්‍රතිලාභියෙකු දැනට ත්‍රීවිලර් හෝ සැහැල්ලු වාහන සඳහා රියදුරු බලපත්‍ර ලබාගෙන වර්ෂ දෙකක කාලයක් ගෙවී ගොස් ඇත්නම් ඔහුට හෝ ඇයට බර වාහන බලපත්රය සඳහා ඉල්ලුම් කිරීමේ අවස්ථාව ඇත.

## 3. සමෘද්ධි ශිල්පීය සවිබලකරණ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන

සමස්ත සමාජය තුල පවතින ශිල්පීය හා පුහුණු ශ්‍රම බලකායේ බලවත් හිඟයත් ඒ නිසා ඇතිවී තිබෙන ඉහළ කේවල් කිරීමේ ශක්තිත්, ශිල්පීය රැකියා අංශයේ අවිධිමත් භාවයටත් පිළියමක් ලෙස සමෘද්ධි වැඩසටහන යටතේ සමෘද්ධිලාභි හා අඩුආදායම්ලාභි රැකියා වියුක්ත තරුණ ප්‍රජාව සඳහා වෘත්තීය පුහුණුව ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක වනු ඇත.

3.1 මෙම වැඩසටහන, වෘත්තීය පුහුණු අධිකාරිය ( VTA ), ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය (NAITA ) හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන අතර මේ වන විටත් එම ආයතන හා සමඟින් මූලික වටයේ සාකාච්ඡාවන් පවත්වා ඇත.

3.2 වැඩසටහන සම්බන්ධයෙන් අංක DSD/HO/04/ER/09/ශිල්පීය සවි. – 2020 හා 2020.01.30 දිනැති උපදෙස් ලිපියක් නිකුත් කර ඇති අතර (ඇමුණුම 02 ) මේ සම්බන්ධයෙන් සියළුම ව්‍යාපෘති කළමණාකරුවන්ද දැණුම්වත් කර ඇති බැවින් සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකින් 10 ක් වන පරිදි රැකියා විරහිත තරුණ ප්‍රජාව, ඇමුණුම් අංක 03 ට අනුව හඳුනා ගැනිමට කටයුතු කළ යුතු වේ.

3.3 මීට අමතරව බර වාහන හා බර යන්ත්‍රෝපකරණ පුහුණුව සඳහාද සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකින්ම දෙදෙනෙක් වන පරිදි ප්‍රතිලාභින් තෝරා ගත යුතුවේ. පිළිගත් ආයතනයකින් පුහුණුව ලබා ගැනීම වෙනුවෙන් එක් ප්‍රතිලාභියෙකු සඳහා වැයවන මුදලින් 25,000 ක් දක්වා දායකත්වයක් දෙපාර්තමේන්තුවට දැරිය හැකි අතර ඉතිරි මුදල ප්‍රතිලාභියා විසින් දැරිය යුතු වේ.

3.4 වෘත්තීය පුහුණුව සඳහා ( ඉහත ඡේද අංක 3.3 හැර ) තෝරා ගනු ලබන පුහුණුලාභින් සඳහා මාසිකව රු. 1,000 /- ක ගමන් වියදමක් ලබා දීමට අපේක්ෂිතය. සාර්ථකව පුහුණුව අවසන් කරන ප්‍රතිලාභින් වෙනුවෙන් ඔවුන්ගේ වෘත්තීමය කටයුතු ආරම්භ කිරීමට සහායක් වශයෙන් රු. 15,000 /- ක උපරිමයකට යටත්ව උපකරණ / මෙවලම් කට්ටලයක් ලබා දීමට කටයුතු කරනු ඇත.

## 4. විශේෂ ජීවනෝපාය ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහන යටතේ ඒ ඒ ප්‍රදේශවල සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන්ගේ ජීවනෝපාය වර්ධනය සහ ඔවුන් ආර්ථිකව සවිබලගැන්වීම සඳහා ඉදිරිපත් කරනු ලබන නව්‍ය හා නිර්මාණාත්මක යෝජනා තුලින් වඩාත්ම ප්‍රශස්ථ යෝජනා තෝරා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මුල්‍ය පහසුකම් සැපයීමත් වෙනත් ආයතන හා සම්බන්ධ වෙමින් සේවාවන් ලබා ගැනීමටත් අපේක්ෂා කෙරේ.

### 4.1 ක්‍රියාත්මක කළයුතු ව්‍යාපෘති යෝජනා

මෙම යෝජනා ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා සෘජුවම ඉවහල් වන සංවර්ධන යෝජනා විය යුතු අතර පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරේ වැඩි අවධානයක් යොමු කෙරේ.

i. සමෘද්ධිලාභින් හා අඩු ආදායම්ලාභීන්ගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා ඉවහල් වන කෘෂිකාර්මික, ධීවර / සත්ත්ව පාලන සහ කර්මාන්ත යන ක්ෂේත්‍රයන්ට අදාල විශේෂ නව්‍ය ව්‍යාපෘති

ii. නිෂ්පාදන අතරමැදියන්ගේ මැදිහත්වීමක් නොමැතිව අලෙවිකර ගැනීම සඳහා සෘජුවම රාජ්‍ය හෝ පෞද්ගලික අංශය සමඟ සම්බන්ධ කිරීමට අවශ්‍ය වන්නාවූ නව්‍ය ව්‍යාපෘති.

iii. ප්‍රතිලාභීන්ගේ නිෂ්පාදන තරඟකාරී වෙළඳපොලට ගැලපෙන පරිදි ප්‍රවර්ධනයට අවශ්‍ය පුහුණු වැඩසටහන් හා නව තාක්ෂණ දැනුම උපයෝගී කරගෙන අගය එකතු කළ නිෂ්පාදන වෙළඳපොලට සැපයීමටත් ඔවුන් දිරිමත් කිරීමටත් අදාල නිර්මාණාත්මක විශේෂිත ව්‍යාපෘති.

iv. පානීය ජල හිඟයෙන් පීඩා විඳින අඩු ආදායම්ලාභී ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීම සඳහා ඉවහල් වන ව්‍යාපෘති.

**a. ප්‍රතිපාදන වෙන් කිරිම**

i. පළමුව ඉහත නිර්ණායකයන්ට අදාලව එක් එක් ව්‍යාපෘතියක් වෙනුවෙන් ව්‍යාපෘති වාර්තා සකස් කළයුතුවේ.

ii. දෙපාර්තමේන්තු දායකත්වය, ව්‍යාපෘති ඇස්තමේන්තු අගයෙන් 60% ක් විය යුතු අතර එක් ප්‍රතිලාභියෙක් වෙනුවෙන් ලබා දිය හැකි උපරිම ප්‍රතිපාදන ප්‍රමාණය රු. 45,000 /- කි. මෙහිදි අවම ප්‍රතිලාභි දායකත්වය 40% ක් වන අතර එය මූල්‍ය දායකත්වයක් විය යුතුය.

iii. මේ අනුව දිස්ත්‍රික්ක වලින් ඉදිරිපත් වන වඩාත් ඵලදායි ව්‍යාපෘති යෝජනා වෙනුවෙන් ප්‍රමුඛතාවය පරිදි ප්‍රතිපාදන නිදහස් කිරිමට කටයුතු කරනු ඇති අතර එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකින් ව්‍යාපෘති වාර්තා 05 ක් වත් ඉලක්ක ගත වනු ඇත.

## 05. විවිධ ව්‍යාපෘති හා ආයතන සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක වැඩසටහන්

**කෘෂි ආර්ථික කලාප සංවර්ධන වැඩසටහන**

වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාශයේ කෘෂිකාර්මික නවීකරණ ව්‍යාපෘතියෙහි මූල්‍ය හා තාක්ෂණික සහාය ලබා ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මූලික අදියරේදී සබරගමුව, දකුණ, මධ්‍යම, උතුර සහ නැගෙනහිර පළාත්හි මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජිත වේ. (මෙම වැඩසටහනට අදාල චක්‍ර ලේඛය සහ වැඩිදුර තොරතුරු ඉදිරියේදී ලබාදීමට කටයුතු කරනු ඇත.)

## 06. පරිපාලන වියදම්

- පළමු කාර්තුව සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන සීමා සහිත වුවත් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පරිදි උක්ත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිත අතර ඉදිරි අය-වැය ප්‍රකාශනයට අනුව ඔබ වෙත වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණයේ යම් යම් වෙනස්වීම් වලට ලක් විය හැකි බව පෙන්වා දෙමි.
- ඒ අනුව වැඩසටහන් යටතේ දරනු ලබන රජයේ වියදමෙන් 2.0 % ක් පරිපාලන වියදම් ලෙස දැරීමට හැකියාව ඇති අතර ඉන් 0.5% ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ද, ඉතිරි 1.5 % ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ද බෙදී යන පරිදි විය යුතුය.
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රමවේදය, මුදල් රෙගුලාසි, මෙම චක්‍රලේඛ උපදෙස් හා අදාල වෙනත් චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින් ක්‍රියාත්මක කළ යුතු අතර සම්මත මිල ගණන්ද සැලකිල්ලට ගෙන අදාල රේඛිය ආයතන වල නිර්දේශයන්ද ලබා ගෙන ගෙවීම් කිරීම අත්‍යාවශ්‍ය වේ.

## 07. අධීක්ෂණය, මෙහෙයවීම හා ඇගයිම

i. වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරී, ව්‍යාපෘති කළමණාකරු ,ප්‍රජා මූල බැංකු කළමණාකරු සහ ප්‍රජා මූල සමිති නිලධාරීන් මසකට වරක් රැස්වී කොට්ඨාශයේ ක්‍රියාත්මක ව්‍යාපෘති, සාර්ථකව නියමිත අරමුණු

කරා යන්නේද පිළිබඳව සාකච්ඡා කිරීම, ගැටළු සඳහා අවශ්‍ය පියවර ගැනීම හා යාවත්කාලීන කිරීම කළ යුතුවේ.

ii. ඉහත නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම්ගේ නිරන්තර අධීක්ෂණය යටතේ සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුය.

iii. රියදුරු පුහුණුව හා බර වාහන / බර යන්ත්‍රෝපකරණ පුහුණුව සඳහා අඛන්ඩව පැමිණීම අනිවාර්ය වන අතර සාර්ථක ලෙස පුහුණුව අවසන් කිරීම පුහුණුලාභියාගේ වගකීම වේ. මෙසේ නොවන අවස්ථා වලදී පුහුණුව සඳහා දෙපාර්තමේන්තුව විසින් දරණ ලද වියදම අය කර ගැනීමට කටයුතු කළයුතු අතර ඒ සඳහා ප්‍රතිලාභියා හා ප්‍රාදේශීය ලේකම් (ප්‍රාදේශිය ලේකම් වෙනුවට මුලස්ථාන කළමණාකරු ) සමඟ ගිවිසුමකට එළඹීම අත්‍යාවශ්‍ය වනු ඇත.

iv. ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ඔවුන්ගේ අවශ්‍යතාවය, නිවසට / වගා බිමට / වැඩපලට ගොස් නිරීක්ෂණය කර පෞද්ගලිකව සෑහීමකට පත් වීමෙන් පසුව ප්‍රමුඛතම අවශ්‍යතාවය හෝ අවශ්‍යතා තීරණය කළ යුතුය.

v. මෙහිදී ප්‍රජා මූල සංවිධාන ද ව්‍යාපෘති අධීක්ෂණය සඳහා සහභාගී කරවා ගත යුතු අතර, සමාජ විගණනයන් සඳහා අවශ්‍ය පරිසරයක් ඇති කළ යුතු වේ.

vi. ඉහත වැඩසටහන් යටතේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදි එක් පවුලක් සඳහා හිමිවිය හැක්කේ එක් ප්‍රතිලාභයක් පමණි.

vii. ප්‍රගතිය අවශ්‍ය ඕනෑම විටක ප්‍රධාන කාර්යාලය වෙත ලබා දිය හැකි පරිදි සකස් කිරීමටත් යාවත්කාලින කිරීමටත් කටයුතු කළ යුතු වේ.

viii. **'සමෘද්ධි ප්‍රතිලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම '** අරමුණු කර ගනිමින් සියළුම ව්‍යාපෘති ක්‍රියාත්මක වීම කෙරෙහි දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ / දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන් නිරන්තර අවධානය යොමු කළ යුතුවේ.

ඉහත සියළු වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ ඇතුළු සමෘද්ධි නිලධාරින්ගේ කැපවීම අගේ කොට සලකන අතර මේ පිළිබඳව වැඩිදුර විස්තර අවශ්‍ය වුවහොත් දුරකතන අංක 011-2873801 මගින් හෝ divinegumalh@yahoo.com විද්‍යුත් තැපැල් ලිපිනය මඟින් ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන අංශය අමතන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

1. කාන්තා,ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය- කා.දැ.ගැ.පි.
2. සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍ය ගරු තාරක බාලසූරිය මැතිතුමා - කා.දැ.ගැ.පි.
3. ලේකම්, කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ - කා.දැ.ගැ.පි.
4. රාජ්‍ය ලේකම්, සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
5. ප්‍රාදේශීය ලේකම්, .................. - කා.දැ.ගැ.පි හා අ.ක.ස
6. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
7. ප්‍රධාන ගණකාධිකාරි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
8. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
7. සියළුම අංශ ප්‍රධානීන් ,සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.